කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

வளிமண்டலவியல் திணைக்களம்

**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2026 අප්‍රේල් මස 11 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2026 අප්‍රේල් මස 11 දින උදෑසන 05.30 ට නිකුත්කරන ලදි.**

බස්නාහිර, සබරගමුව, වයඹ, දකුණු සහ ඌව පළාත්වලත් අනුරාධපුර, මන්නාරම, මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලත් ප.ව 2.00 න් පසුව තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

දිවයිනේ සෙසු ප්‍රදේශවල ප්‍රධාන වශයෙන් වියළි කාලගුණික තත්ත්වයක් පවතී.

මධ්‍යම, සබරගමුව සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවල අළුයම් කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**දෘශ්‍ය ලෙස සූර්යයා උතුරට ගමන් කිරීමේදී සූර්යයා, අප්‍රේල් මස 05 සිට 15 දක්වා දිනවලදී ශ්‍රී ලංකාව ආශ්‍රිත අක්ෂාංශවලට සෘජුවම ඉහලින් පවතී. අද (11) දින දහවල් 12:11 ට පොම්පරිප්පු, අනුරාධපුර, මිහින්තලේ, ගලෙන්බිඳුණුවැව, අග්බෝපුර සහ සේරුනුවර යන ප්‍රදේශවලට හිරු මුදුන් වනු ඇත.**

**WEATHER FORECAST FOR 11 APRIL 2026**
**Issued at 05.30 a.m. on 11 April 2026.**

Showers or thundershowers will occur at several places in Western, Sabaragamuwa, North-western, Southern and Uva provinces and in Anuradhapura, Mannar, Kandy and Nuwara-Eliya districts after 2.00 p.m.

Mainly dry weather will prevail over the other parts of the island.

Misty conditions can be expected at some places in Central, Sabaragamuwa and Uva provinces during the early hours of the morning.

**The general public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

**On the apparent northward relative motion of the sun, it is going to be directly over the latitudes of Sri Lanka during 05$^{th}$ to 15$^{th}$ of April in this year. The nearest areas of Sri Lanka over which the sun is overhead today (11$^{th}$) are Pomparippu, Anuradhapura, Mihinthale, Galenbindunuwewa, Agbopura and Serunuwara about 12:11 noon.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2026 අප්‍රේල් මස 11 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

| |
|---|
| **වැසි තත්ත්වය:** |
| ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක. |
| **සුළඟ:** |
| සුළං නිරිත දිශාවෙන් හෝ නිශ්චිත දිශාවකින් තොරව හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. (20-30) පමණ වේ. මන්නාරම සිට පුත්තලම හරහා කොළඹ දක්වාත් පොතුවිල් සිට මඩකලපුව හරහා ත්‍රිකුණාමලය දක්වාත් වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. 40** දක්වා වැඩි විය හැක. |
| **මුහුදේ ස්වභාවය:** |
| මන්නාරම සිට පුත්තලම හරහා කොළඹ දක්වාත් පොතුවිල් සිට මඩකලපුව හරහා ත්‍රිකුණාමලය දක්වාත් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ සාමාන්‍ය ස්වභාවයේ පවතී.<br>**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

**Issued at 05.30 a.m. on 11 April 2026**

| |
|---|
| **Condition of Rain:** |
| Showers or thundershowers will occur at several places in the sea areas off the coast extending from Galle to Pottuvil via Hambantota.<br>Showers or thundershowers are likely at a few places in the other sea areas during the evening or night. |
| **Winds:** |
| Winds will be south-westerly or variable in direction. Wind speed will be (20-30) kmph. Wind speed can increase up to **40 kmph** at times in the sea areas off the coast extending from Mannar to Colombo via Puttalam, and from Pottuvil to Trincomalee via Batticaloa. |
| **State of Sea:** |
| The sea areas off the coast extending from Mannar to Colombo via Puttalam, and from Pottuvil to Trincomalee via Batticaloa may be fairly rough at times. The other sea areas around the island will be slight.<br>**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.** |

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි